# දරුවන් උදෙසා බයිබලයක්

## ජේසුස් වහන්සේ ගෝලයින් දොළොස් දෙනෙකු තෝරා ගන්නා සේක



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus Alastair Paterson

සකස්කරන්නා: E. Frischbutter; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ජේසුස් වහන්සේ පුදුම දෑ කළ සේක. උන්වහන්සේ රෝග සුව කළ සේක, කැළඹුණු මිනිසුන්ගේ හිත් සහ මනසට සාමය ගෙන දුන් සේක, දෙවියන් වහන්සේගේ වචනය ඉගැන්වූ සේක.



ජනතාව ජේසුස් වහන්සේ වෙතට පිහිට සහ සුවය පතා පැමිණියෝය. උන්වහන්සේ තමන් හට දෙවියන් වහන්සේගේ කාර්යයන් වලදී උදව් කරනු සඳහා තමන් වහන්සේ පසුපස පැමිණෙන අයගෙන් දොළොස් දෙනෙකු තෝරා ගන්නට තීරණය කළසේක.



ඔබට වැදගත්
තෝරාගැනීම්
කරන්නට සිදුවෙද්දී ඔබ
දෙවියන්වහන්සේට
යාච්ඤා කරනවාද?
ජේසුස් වහන්සේ එසේ
කළසේක! නිස්කලංක
කඳුකර පෙදෙසක දී
උන්වහන්සේ ස්වර්ගීය
පියාණන්ට කතා
කළසේක. ඉර බැස යන
තෙක්ම ජේසුස් වහන්සේ
යාච්ඤා කළසේක.





ජේසුස් වහන්සේ
දීර්ඝ අඳුරු
රාත්‍රිය පුරාම
යාච්ඤා
කළසේක.

උදෑසන, ජේසුස් වහන්සේ උන්වහන්සේ පසුපස ආ අය හා උන්වහන්සේට සේවය කරමින් කීකරු වූ මිතුරන් කැඳවූ සේක. ඔවුන් අතරින් උන්වහන්සේ, විශේෂ උදව්කරුවන් එනම් අපොස්තොළුවරුන් වන්නට දොළොස් දෙනෙක් තෝරා ගත් සේක.



ජේසුස් වහන්සේ පළමුවෙන් තෝරා ගත් දෙදෙනා සහෝදරයන් වූවෝය. ඒ සීමොන් පේතෘස් පේදුරු සහ ඇන්ඩෘ ය. ජේසුස් වහන්සේ ඔවුන්ට තමන් වහන්සේ පිටුපස එන්නට හඬ ගැසූ විට, කරමින් සිටි රැකියාව වූ මසුන් ඇල්ලීම නවතා දමා ආවෝය.



සෙබදී ගේ පුත්‍රයන් වූ ජාකොබ්
සහ ජොහාන් ද ඔවුන්ගේ මාළු
දැල් අතහැර පැමිණියෝය.



ජේසුස් වහන්සේ තවත් අය තෝරා ගත් සේක. ඒ, පිලිප්, බර්තොලමෙව්, මතෙව්, තෝමස්, සීලට් කණ්ඩායමේ වුන් සීමොන්, අල්පෙවුස් ගේ පුත්‍රයා වූ ජාකොබ්, ජාකොබ් ගේ සහෝදරයා වූ ජූදස් සහ පසු කාලෙක ජේසුස් වහන්සේගේ හතුරා වූ ජූදස් ඉස්කාරියෝත් යන අයය.



තමන් වහන්සේ කියන දේ කිරීම ශක්තිමත් අත්තිවාරමක් උඩ ගෙයක් තනනවා හා සමාන බව ජේසුස් වහන්සේ ඉගැන්වූ සේක. දරුණු කුණාටු වලට ඒ ගෙය විනාශ කළ නොහැකිය.



නමුත් ජේසුස් වහන්සේගේ වචනයට අකීකරු වීම වැලි මත තැනූ ගෙදරකට සමානය. කුණාටුවක් හැමූ විට නිවස කැඩී යනු ඇත.



ජේසුස් වහන්සේ දුන් සමහර අණ ඉටු කිරීම පහසු නොවේ. "කෙනෙකු ඔබේ දකුණු කම්මුලට ගැසුවොත්, වම් කම්මුලද හරවන්න යැ" යි උන්වහන්සේ ඉගැන්වූ සේක. ජේසුස් වහන්සේ මෙන් ජීවත් වන්නට දෙවියන් වහන්සේගේ උපකාරය මිනිසුන්ට අවශ්‍ය වේ.



එසේම ජේසුස් වහන්සේ
මිනිසුන්ට යාච්ඤා කරද්දී,
සමහර ආගම් නායකයන්
කරන්නාක් මෙන් මිනිසුන්ට
පෙනෙන්න යාච්ඤා
නොකර එය රහසින් කරන
ලෙස කී සේක.



දෙවියන් වහන්සේ තමන්වහසේ
ව විශ්වාස කරන අය
බඩගින්නේවත් ඇඳුම් නැතිව වත්
නොතබන බව ජේසුස් වහන්සේ කී
සේක. කුරුල්ලන්ට පවා කෑමද මල්,
පඳුරු වලට පවා ලස්සන වර්ණද දෙන
දෙවියන් වහන්සේ කෙරෙහි මිනිසුන්ට
ඔවුන්ගේ අවශ්‍යතා වලදී
විශ්වාසය තැබිය හැකිය.



ජේසුස් වහන්සේ,
උන්වහන්සේ අලුතින්
තෝරාගත් උදව්කරුවන්
දොළොස් දෙනා හට එදා
දවසේදී බොහෝ දේ ඉගැන්වූ
සේක. ජේසුස් වහන්සේ
ඉගැන්වීම නිම කළ පසු,
ලාදුරු රෝගියෙකු ඇවිත්
ජේසුස් වහන්සේට ඔහුව
සුවකර දෙන ලෙස කියා
බැගෑපත් වූයේය.



ජේසුස් වහන්සේ ලාදුරු රෝගියාට පිළිතුරු
දෙමින් “මම එය කරන්නම්. සුව වෙන්නයැ” යි කී සේක.



ගෝලයින් බලා සිටිද්දීම ලාදුරු
රෝගියා සම්පූර්ණයෙන් සුව
වූයේය. එය කළ හැකි
වූයේ දෙවියන්වහන්සේගේ
පුත්‍රයා ට පමණි. තමුන්ට
සිටින්නේ පුදුම දේ කළ හැකි
ස්වාමියෙකු බව ගෝලයෝ
දැනගත්තෝය.

ජේසුස් වහන්සේ ගෝලයින් දොළොස් දෙනෙකු
තෝරා ගන්නා සේක

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. මතෙව් 4-7,  ශු. මාර්ක් 1, ශු. ලූක් 6

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)